# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 226/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 08/02/2024

පැය 1720

## මාධ්‍ය නිවේදනය

**පොලිස් සිර මැදිරියේ රඳවා සිටි සැකකරුවන් දෙදෙනෙකුට විෂ මිශ්‍ර කිරි තේ පැකැට්ටුවක් ලබා දී මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම - ආදුරුප්පුවීදිය පොලිස් ස්ථානය.**

ආදුරුප්පුවීදිය පොලිස් වසමේ වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමේ අපරාධයට අදාලව 2024.02.01 වන දින ත්‍රිකුණාමලය සේරුනුවර ලිපිනයේ පදිංචි පුද්ගලයෙකු මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම හා හෙරොයින් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් ආදුරප්පුවීදිය පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන තිබිණි. එම සැකකරු මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.02.07 වන දින දක්වා රැඳවුම් නියෝග ලබාගෙන ස්ථානයේ සිර මැදිරියේ රඳවාගෙන විමර්ශන සිදු කර ඇත.

2024.02.06 වන දින ඉහත අපරාධයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් ජින්තුපිටිය, කොළඹ 13 ප්‍රදේශයේ පදිංචි තවත් පුද්ගලයෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට ගෙන එම සැකකරුද ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා ඉහත සැකකරු සිටි සිර මැදිරියේම රඳවා සිට ඇත.

2024.02.07 වන දින දහවල් කාලයේදී ඉහත දෙවන සැකකරු බැලීම සඳහා ආදුරුප්පුවීදිය පොලිස් ස්ථානයට පැමිණි පුද්ගලයකු විසින් සැකකරුට ලබා දීමට කෙටි ආහාර අඩංගු පාර්සලයක් රැගෙන පැමිණ ඇත. පොලිස් ස්ථානයේ දිවා රාජකාරී යෙදී සිටි උපසේවක නිලධාරියා විසින් එම පාර්සලය පරීක්ෂාවට ලක් කිරීමේදී එහි බනිස්, කිරි තේ පැකට්ටුවක් හා සිගරට් පැකැට්ටුවක් තිබී ඇති අතර සිගරට් පැකැට්ටුව නොමැතිව බනිස් හා තේ පාර්සලය පමණක් සිරි මැදියේ රඳවා සිටි සැකකරුට ලබාදීමට අවසර ලබා දී ඇත. ඒ අනුව පැමිණි පුද්ගලයා විසින් එම සැකකරුට අදාල පාර්සලය ලබා දී එම ස්ථානයෙන් පිටව ගොස් ඇත.

එම අවස්ථාවේ එම සැකකරු බැලීමට ඔහුගේ බිරිඳ ද පැමිණ සිට ඇති අතර පිටතින් පැමිණි පුද්ගලයා විසින් රැගෙන එන ලද බනිස් හා කිරි තේ පාර්සලය ඉහත සැකකරුවන් දෙදෙනා විසින් බෙදාගෙන ආහාරයට ගෙන කිරි තේ පාර්සලය ද දෙදෙනාම පානය කර ඇත. එසේ පානය කිරීමේදී සැකකරුවන් දෙදෙනාම සිර මැදිරිය තුල බිම ඇද වැටී ඇත. අනතුරුව පොලිස්

ස්ථානයේ නිලධාරීන් විසින් සැකකරුවන් දෙදෙනා පරීක්ෂා කිරීමේදී ඔවුන්ට කතා කිරීමට නොහැකිව අසාධ්‍ය තත්වයේ සිටිම හේතුවෙන් වහාම කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමට කටයුතු කර ඇති අතර ඔවුන් දැනට දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටී.

ඉහත සිදුවීම සිදුවන අවස්ථාවේ උපසේවක රාජකාරි යෙදී සිටි නිලධාරියා, ස්ථානයේ ආරක්ෂක රාජකාරි යෙදී සිටි නිලධාරියා හා වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කල පොලිස් පරීක්ෂකවරයාගේ රාජකාරී වැඩ තහනමට ලක් කර ඇත. මේ සම්බන්ධයෙන් කොළඹ මධ්‍යම කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**